# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

කේ.ජී.එන්.පී.එච්.එම්.අයි.
මොහොම්මඩ්
අංක 07,
ටෙලිකොම් පාර,
අකුරණ

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය : 54/2022** **එදිරිව**

ඉඩම් කොමසාරිස් ජනරාල්
දෙපාර්තමේන්තුව
1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ ඉඩම් කොමසාරිස් ලක්මාලි ජයසුන්දර මිය (තොරතුරු නිලධාරි) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.06.23

**තීරණය කළ දිනය** : 2022.06.23

<u>**තීරණය :**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2021.05.18 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

1) *"ගරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් විසින් 2017.06.19 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපිය සඳහන්කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ග සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය. පිටපත් අමුණා ඇත.*

   *අතිරේක ලේකම් (බිම්සවිය) විසින් 2018.12.31 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. පිටපත් අමුණා ඇත. එම ලිපියේ සඳහන්කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ග සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය.*

2) *අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) විසින් 2015.11.20 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධව සවිස්තර තොරතුරු ලබා දෙන මැනවිය. පිටපත් අමුණා ඇත.*

3) *සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම් විසින් 2012.09.12 වැනි දින නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපිය සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ගය සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය.*

4) *අතිරේක ලේකම් (සංවර්ධන) ඉඩම් හා ඉඩම් අමාත්‍ය විසින් 2020.08.11 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ගය සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය.*

5) *ප්‍රාදේශීය ලේකම් තමන්කඩුව විසින් 2005.01.25 වැනි දින නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ග සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය.*

6) *ගරු අමාත්‍යතුමා විසින් 2012.11.28 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ග සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය.*

7) *අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) ලේකම් වෙනුවට (ඉඩම් හා පාර්ලිමේන්තුව) විසින් 2018.04.23 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ගය සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන මැනවිය.*

8) *මා විසින් 2021.03.13 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ග සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.*

9) *මා විසින් 2021.03.02 වැනි දින ඉඩම් කොමසාරිස් ජනරාල් අමතන ලද ලිපිය හා බැඳේ. එම ලිපියේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධව ගනුලබන ක්‍රියාමාර්ග සම්බන්ධව සවිස්තර තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි. (පිටපත් අමුණා ඇත.)"*

තොරතුරු නිලධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2021.07.24 දිනැතිව නම්කළ නිළධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරියා විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2021.10.30 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2021.05.18 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2021.07.24 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හටද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා සහ නම්කළ නිළධාරියා විසින් පැහැර හැර ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

**සළකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමට අදාළ ලිපි තොරතුරු ඉල්ලීම සමග අමුණා ඇත යනුවෙන් සඳහන් කර ඇතත්, කොමිෂන් සභාව වෙත එවා ඇති අභියාචනා සමග එකී ඇමුණුම් කිසිවක් අභියාචක විසින් ඉදිරිපත් කර නොමැත. මෙම ඇමුණුම් කොමිෂන් සභාව වෙතට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ අදාළ නිලධාරින් විසින් විවිධ අවස්ථාවලදී දැනුම් දී ඇතත්, එකී දැන්වීම් වලට අනුගත වී අදාළ ඇමුණුම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අභියාචක අසමත් වී ඇත. එවැනි ස්ථාවරයක සිටි අභියාචක අද දින පරීක්ෂණයේදී එම ඇමුණුම් යැයි සඳහන් කරමින් ලිපි විශාල ප්‍රමාණයක ගොනුවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ලිපි කිසිදු ආකාරයකින් හෝ තොරතුරු ඉල්ලීම හා ගැළපීමට මෙම අවස්ථාවේදී හැකියාවක් නොමැති බැවින් එකී ලිපි පරීක්ෂණය අවස්ථාවේදී භාර ගැනීම කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

එපමණක්ද නොව, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමෙහි අන්තර්ගත වන්නේ පොදු අධිකාරිය විසින් අනාගතයේදී ගනු ලැබීමට යන ක්‍රියාමාර්ග විමසීමකි. අනාගතයේදී සිදු කරන ක්‍රියා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 43 වන වගන්තියේ දැක්වෙන "තොරතුරු" යන අර්ථනිරූපණය තුළට නොගැනේ. එබැවින්, උක්ත කරුණු කෙසේ වුවත් ඉහත සඳහන් අභියාචනා සියල්ලටම පාදක වී ඇති තොරතුරු ඉල්ලීම් පනතේ 43 වන වගන්තියේ "තොරතුර" යන අර්ථනිරූපණය තුළ නොගැනෙන බැවින් එකී අභියාචනා සළකා බැලීමට මේ අනුව කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් එම කරුණු සළකා බලා මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට අපි තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිළධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබේ.